# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2176/22 - 2020 මැයි මස 22 වැනි සිකුරාදා - 2020.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ කොළඹ මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කොළඹ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ කොළඹ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයකු ලෙස පත්වූ රාසයියා ගනේෂන් අයත් වන්නා වූ අංක 2 දරන ස්වාධීන කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම කොළඹ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් අංක 02හි කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සමීර ධනංජය පීරිස් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කොළඹ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි, පතිරාජ ආරච්චිලාගේ සුනිල් සේනාරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සමීර ධනංජය පීරිස්, කොළඹ මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරි,
කොළඹ මහ නගර සභාව.

2020 මැයි මස 21 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ නාගරිකය.

06 - 12


1A - G 32256 — 27 (2020/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*